# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2319/21 - 2023 පෙබරවාරි මස 13 වැනි සඳුදා - 2023.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2012 (IV)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (ද) ඡේදය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**ඩග්ලස් දේවානන්දා,**
ධීවර අමාත්‍ය.

2023 පෙබරවාරි මස 06 වැනි දින,
කොළඹ දීය.

නියෝග

1. මෙම නියෝග 2023 අංක 1 දරන කෘතිම උපස්ථර මත වගා කරන ලද කොරල් විශේෂ ආනයනය හා අපනයනය කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. අන්තරායට ලක් වූ සත්ව හා ශාක විශේෂවල අන්තර්ජාතික වෙළෙඳාම පිළිබඳ සම්මුතියේ (CITES) ලැයිස්තුගත කර ඇති යම් කොරල් විශේෂ ආනයනය කිරීම සඳහා වන සෑම බලපත්‍රයක්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතු අතර අනෙකුත් විශේෂවලට අදාළ බලපත්‍රය මෙහි වන II උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ධීවර සහ ජලජ සම්පත් පනතේ 39 වන වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල යුතුය.

3. යම් තැනැත්තෙකු විසින් කෘතිම උපස්ථර මත වගා කරන ලද යම් කොරල් විශේෂයක්, එකී කොරල් විශේෂය 2017 අගෝස්තු මස 14 වැනි දින අංක-2032/5 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2017 අංක 01 දරන අපනයනය සඳහා කෘතිම උපස්ථර මත කොරල් විශේෂ වගා කිරීමේ නියෝග ප්‍රකාර කෘතිම උපස්ථර මත වගා කරන ලද කොරල් විශේෂයන් වන්නේ නම් මිස, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම නොකළ යුතුය.

4. අපනයනය සඳහා කොරල් විශේෂ වගා කිරීම සඳහා භාවිත කරනු ලබන උපස්ථර 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් අනුමත කර තිබිය යුතු ය.

5. කෘතිම උපස්ථර මත වගා කරන ලද කොරල් විශේෂ අපනයනය කිරීම සඳහා වන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍රය මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති II වන ආකෘතිපත්‍රයට සාරානුකූලව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

6. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, 5 වන නියෝගයේ නිශ්චිතව සඳහන් එවැනි ඉල්ලුම්පත්‍රයක් ලැබුණු විට, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අනුමැතිය ඇතිව, එම "බලපත්‍රයේ නිශ්චිතව දක්වා" ඇති නියම හා කොන්දේසිවලට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති IV වන ආකෘති පත්‍රයට සාරානුකූලව බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

7. එවැනි බලපත්‍රයක් එහි නියම හා කොන්දේසි හෝ මේ නියෝගවල යම් විධිවිධානයක් හෝ කඩ කිරීම හේතුවෙන් කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස නිකුත් කල දින සිට මාස හයක කාලසීමාවක් සඳහා වලංගු විය යුතුය.

8. කෘතීම උපස්ථර මත වගා කරන ලද කොරල් විශේෂ ආනයනය කිරීමේ බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රයක් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති I වන ආකෘති පත්‍රයට සාරානුකූලව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

9. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, 8 වන නියෝගයේ නිශ්චිතව සඳහන් එවැනි ඉල්ලුම්පත්‍රයක් ලැබුණු විට, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අනුමැතිය ඇතිව එම බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති නියම හා කොන්දේසිවලට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති III වන ආකෘති පත්‍රයට සාරානුකූල බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතුය.

10. එවැනි බලපත්‍රයක් එහි නියම හා කොන්දේසි හෝ මේ නියෝගවල යම් විධිවිධානයක් හෝ කඩ කිරීම හේතුවෙන් කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස නිකුත් කල දින සිට මාස හයක කාලසීමාවක් සඳහා වලංගු විය යුතුය.

11. මේ නියෝගවල -

"අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන්නෙන් 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

**I වන උපලේඛනය**

**I වන ආකෘති පත්‍රය**

(8 වන නියෝගය)

වගා කරන ලද කොරල් විශේෂ ආනයනය කිරීමේ බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නමඃ

2. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනයඃ

   (අ) තැපැල් ලිපිනය
   (ආ) විද්‍යුත් තැපැල
   (ඇ) දුරකථන අංකයඃ
   (ඈ) ෆැක්ස් අංකයඃ

3. ජාතික හැඳුනුම්පත් අංකයඃ

4. ව්‍යාපාර ලියාපදිංචි අංකයඃ

5. භාණ්ඩ තොගය පිළිබඳ විස්තරඃ

| වර්ගය | | ආනයනය කරන ප්‍රමාණය | අපනයනය කරන දිනය | අපනයනය කරනු ලබන රට |
|---|---|---|---|---|
| වාණිජ නම | විද්‍යාත්මක නම | | | |
| | | | | |
| | | | | |

6. කිලෝග්‍රෑමයක්/කැබැල්ලක්/ .................... සඳහා අය කළ හැකි ගාස්තුව රු. .................... විය යුතුය.

7. කොරල් විශේෂ ප්‍රතිඅපනයනය කරනු ලබන රටේ /රටවල නම්ː

ඉහත සඳහන් ප්‍රකාශය සත්‍ය බවට ද නිවැරදි බවට ද මම/අපි මෙයින් සහතික වෙමි/වෙමු. මෙහි සඳහන් විස්තර කිසිවක් වැරදි බව පෙනී ගියහොත්, එම විස්තර පදනම් කරගෙන නිකුත් කරන ලද මේ බලපත්‍රය අවලංගු කරනු ලැබීමට යටත් වන බවට මම/අපි එකඟ වෙමි/වෙමු.

........................................
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය ː ...............................................

**II** වන ආකෘති පත්‍රය

(5 වන නියෝගය)

කෘතිම උපස්ථර මත වගා කරන ලද කොරල් විශේෂ අපනයනය කිරීමේ බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නමː

2. ඉල්ලුම්කරුගේ ස්ථිර ලිපිනයː

(අ) තැපැල් ලිපිනය
(ආ) විද්‍යුත් තැපැල
(ඇ) දුරකථන අංකයː
(ඈ) ෆැක්ස් අංකයː

3. ජාතික හැඳුනුම්පත් අංකයː

4. ව්‍යාපාර ලියාපදිංචි අංකයː

5. භාණ්ඩ තොගය පිළිබඳ විස්තරː

| වර්ගය | | ඒකකයක අඩංගු ප්‍රමාණය (කි.ග්‍රෑ) | මුළු බර (කි.ග්‍රෑ) | වගා කරන ලද ස්ථානය |
|---|---|---|---|---|
| වාණිජ නම | විද්‍යාත්මක නම | | | |
| | | | | |
| | | | | |

6. අපනයන සංවර්ධන මණ්ඩලයේ ලියපදිංචි අංකයː

7. කිලෝග්‍රෑමයක්/කැබැල්ලක්/ .................... සඳහා අය කළ හැකි ගාස්තුව රු. .................... විය යුතුය.

8. අපනයනය කරනු ලබන රටː

9. අමතර තොරතුරුː

10. ජලජීවි වගා කළමනාකරණ බලපත්‍ර අංකයඃ

ඉහත සඳහන් ප්‍රකාශය සත්‍ය බවට ද නිවැරදි බවට ද මම/අපි මෙයින් සහතික වෙමි/වෙමු. මෙහි සඳහන් විස්තර කිසිවක් වැරදි බව පෙනී ගියහොත්, එම විස්තර පදනම් කරගෙන නිකුත් කරන ලද මේ බලපත්‍රය අවලංගු කරනු ලැබීමට යටත් වන බවට මම/අපි එකඟ වෙමි/වෙමු.

........................................
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය ඃ ................................................

**II** වන උපලේඛනය

**III** වන ආකෘති පත්‍රය

(9 වන නියෝගය)

ධීවර හා ජලජ සම්පත් දෙපාර්මේන්තුව

නව මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10,
ශ්‍රී ලංකාව.

බලපත්‍ර අංකයඃ ..........................................

කෘතිම උපස්ථර මත වගා කරන ලද කොරල් විශේෂ ආනයනය කිරීමේ බලපත්‍රය

.................................................................................. හි පදිංචි ..................................................... ට පහත 2 (III) වන ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති කෘතීම උපස්ථර මත වගා කරන ලද කොරල් විශේෂ ආනයනය කිරීම සඳහා මෙයින් අවසර දෙනු ලැබේ.

| වර්ගය | | ඒකකයක අඩංගු ප්‍රමාණය (කි.ග්‍රෑ) |
|---|---|---|
| වාණිජ නම | විද්‍යාත්මක නම | |
| | | |
| | | |

1. මේ බලපත්‍රය නිකුත් කළ දින සිට මාස 06 ක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

2. මේ බලපත්‍රය පහත දැක්වෙන නියම හා කොන්දේසි වලට යටත් විය යුතුය.

   (i) මේ බලපත්‍රය මෙහි නම් කර ඇති තැනැත්තා විසින් භාවිත කරනු ලැබිය යුතු අතර එය වෙනත් යම් තැනැත්තකුට පවරනු නොලැබිය යුතු ය.
   (ii) මේ බලපත්‍රය 2017 අංක 1 දරන අපනයනය සඳහා කෘතිම උපස්ථර මත කොරල් විශේෂ වගාකිරීමේ නියෝගවල විධිවිධානවලට යටත් විය යුතු ය.
   (iii) මේ බලපත්‍රය අනුක්‍රමික අංක ..................... දරන කෘතිම උපස්ථර මත වගා කරන ලද කොරල් විශේෂ ආනයනය කිරීම සඳහා පමණක් අදාළ විය යුතු ය.

3. අමතර නියම හා කොන්දේසි

........................................
අධ්‍යක්ෂ - ජනරාල්,
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

දිනය ඃ ................................................

**IV** වන ආකෘති පත්‍රය

(6 වන නියෝගය)

ධීවර හා ජලජ සම්පත් දෙපාර්මේන්තුව

නව මහ ලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10,
ශ්‍රී ලංකාව.

බලපත්‍ර අංකයඃ ..........................................

කෘතිම උපස්ථර මත වගා කරන ලද කොරල් විශේෂ අපනයනය කිරීමේ බලපත්‍රය

.................................................................................. හි පදිංචි ...................................................... ට පහත 2 (III) වන ඡේදයේ නිශ්චිතව සඳහන් අනුක්‍රමික අංකය දරන කෘතීම උපස්ථර මත වගා කරන ලද කොරල් විශේෂ අපනයනය කිරීම සඳහා මෙයින් අවසර දෙනු ලැබේ.

| වර්ගය | | ඒකකයක අඩංගු ප්‍රමාණය (කි.ග්‍රෑ) |
|---|---|---|
| වාණිජ නම | විද්‍යාත්මක නම | |
| | | |
| | | |

1. මේ බලපත්‍රය නිකුත් කළ දින සිට මාස 06 ක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

2. මේ බලපත්‍රය පහත දැක්වෙන නියම හා කොන්දේසි වලට යටත් විය යුතුය.

   (i) මේ බලපත්‍රය මෙහි නම් කර ඇති තැනැත්තා විසින් භාවිත කරනු ලැබිය යුතු අතර එය වෙනත් යම් තැනැත්තකුට පවරනු නොලැබිය යුතු ය.

   (ii) මේ බලපත්‍රය 2017 අංක 1 දරන අපනයනය සඳහා කෘතිම උපස්ථර මත කොරල් විශේෂ වගාකිරීමේ නියෝගවල විධිවිධානවලට යටත් විය යුතු ය.

   (iii) මේ බලපත්‍රය අනුක්‍රමික අංක ..................... දරන කෘතිම උපස්ථර මත වගා කරන ලද කොරල් විශේෂ අපනයනය කිරීම සඳහා පමණක් අදාළ විය යුතු ය.

3. අමතර නියම හා කොන්දේසි

.........................................
අධ්‍යක්ෂ - ජනරාල්,
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

දිනය ඃ ................................................

EOG 02-0139

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.